# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,073 — 1960 මාර්තු 4 වැනි සිකුරාද — 4.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට |
|---|---|
| **ඉඩම් නිරවුල්කිරීම පිළිබඳ දැන්වීම් :—** | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :—** | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 129 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 137 |
| ඉඩම් සිම් ගැම් ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : 3/41/78.

### 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම් මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් පිළිබඳ අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත්) ආඥාපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

මාතලේ දිස්ත්‍රික්කයේ දකුණු මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මාතලේ නගර සීමාව තුළ කොට්ඨාශ අංක 9හි, ත්‍රිකුණාමල වීදියේ පිහිටි තක්සේරු අංක 632, 620 සහ 620/1, 624 සහ 616, 616/1 (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 228, 61, 62 සහ 259) දරණ ඉඩම්වලින් අක්කර 4, රූඩ් 3, පර්චස් 05ක පමණ බිම් ප්‍රමාණය ඇති බිම් කට්ටි 5.

බිම් කට්ටි ඒ. ප්‍රමාණය : අ. 2, රූ. 1, ප. 0 පමණ. ඉඩමට නමක් නැත. ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 632, මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 228, කොට්ඨාශ අංක 9, ගොංගාවලගම.

උතුරට : ත්‍රිකුණාමල වීදියේ පිහිටි තක්සේරු අංකයක් නොමැති ඉඩම (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 144) සහ තක්සේරු අංක 620, 620/1 සහ 624 දරණ ඉඩම, ත්‍රිකුණාමල වීදිය, (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 62.) ; නැගෙනහිරට : ගොංගාවල ගමේ පිහිටි කළුදෑවෙල වත්ත (නගර සීමාවෙන් පිට) ; දකුණට : තාරලන්ද පාරේ තක්සේරු අංක 22 සහ 22/1 දරණ ඉඩම්වල කොටස් (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 229) සහ මූලික සිතියම් අංක ඒ 2052 පෙන්නුම් කරන ඉඩම තාරලන්ද පාරේ තක්සේරු අංක 22 සහ 22/1 දරණ ඉඩම් වලින් කොටස්) (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 229) ; බස්නාහිරට : ජලය නොමැති ඇල.

බිම් කට්ටි බී. ප්‍රමාණය : පර්චස් 30ක් පමණ, ඉඩමට නමක් නැත. ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 620 සහ 620/1 දරණ ඉඩම, මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 61, කොට්ඨාශ අංක 9, හරස්ගම.

උතුරට සහ නැගෙනහිරට : ජලය නොමැති ඇල ; දකුණට : ගොඩ පොල ඇල ; බස්නාහිරට : ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 620 සහ 620/1 (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 61.)

බිම් කට්ටි සී. ප්‍රමාණය : අක්කර 2ක් පමණ. ඉඩමට නමක් නැත. ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 620 සහ 620/1 දරණ ඉඩමෙන් කොටසක්, මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 61, කොට්ඨාශ අංක 9, හරස්ගම ගම.

උතුරට : ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 620, 620/1 සහ 624 (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 62) ; නැගෙනහිරට : ජලය නොමැති ඇල ; දකුණට : ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 620 සහ 620/1 (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 61) ගොඩ පොල ඇල, ත්‍රිකුණාමල වීදියේ පිහිටි තක්සේරු අංකයක් නොමැති ඉඩම් (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 57 සහ 60), ත්‍රිකුණාමල විදියේ තක්සේරු අංක 612/5, 612/4, 612/3, 612/2, සහ 612/1 දරණ ඉඩම්, (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 196, 195, 194, 193, 192) සහ ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 616 සහ 616/1, (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 259) ; බස්නාහිරට : ත්‍රිකුණාමල වීදිය සහ ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංකයක් නොමැති ඉඩම, (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 51),


129—ජේ. ඇන්. බී 22126—934 (2/60)

**බිම් කට්ටි ඕ.** ප්‍රමාණය : රූඩ් 1ක් පමණ, ඉඩමට නමක් නැත. ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 620, 620/1 සහ 624, මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 62, කොට්ඨාශ අංක 9, හරස් ගම.

උතුරට : එම ඉඩමේ ඉතුරු කොටස ; නැගෙනහිරට : ජලය නොමැති ඇල ; බස්නාහිරට සහ දකුණට : ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 620 සහ 621/1 දරණ ඉඩම්, (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 61).

**බිම් කට්ටි ර්.** ප්‍රමාණය : පර්චස් 15ක් පමණ. ඉඩමට නමක් නැත. ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 616 සහ 616/1, මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 259 සහ තක්සේරු අංකයක් නොමැති ඉඩම, මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 60, කොට්ඨාශ අංක 9, හරස් ගම ගම.

උතුරට : ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 620 සහ 620/1 (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 61) ; නැගෙනහිරට : ත්‍රිකුණාමල වීදියේ තක්සේරු අංක 612/1 (මාතලේ නගර සිතියමේ බිම් කට්ටි 192) ; දකුණට : එම ඉඩමේ ඉතුරු කොටස ; බස්නාහිරට : ත්‍රිකුණාමල වීදිය.

ඩබ්ලිව්. දහනායක.
කෘෂිකම් සහ ඉඩම් පිළිබඳ ඇමැති.

සඳහන් අංකය : ජේ 58/59 ඇන් ඇස් 607.
1960 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපණත

### 5වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධි විධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධනය වූ 1950යේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

ගාළු දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, ගාළු නාගරික සභා සීමාව තුල, කොට්ඨාශ අංක 9 දරණ මීනුවන්ගොඩ, මඩවලමුල්ල ගම්මුලාදෑනි වසමට අයිති, මඩවලමුල්ල නමැති ගමේ පිහිටි, වක්වැල්ල පාරේ වරිපනම් අංක 248, 248/2ඒ, 248/3 සහ 248/4න් හැඳින්වෙන, ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, ප. 36ක් පමණ වූ, පහත සඳහන් මායිම් තුල පිහිටි, කිරිමැටියවත්ත නොහොත් කිරිමැටියවත්ත අද්දර ඕවිට නමැති සම්පූර්ණ ඉඩම.

උතුරට : වක්වැල්ල පාරේ, වරිපනම් අංක 250න් හැඳින්වෙන සංඝමිත්ත මහා විද්‍යාල ඉඩම ; නැගෙනහිරට : සංඝමිත්ත මහා විද්‍යාල ඉඩම සහ ඊ. විජේසුන්දර මහතා අයිතිවාසිකම් කියන වැක්වැල්ල පාරේ වරිපනම් අංක 244/4න් හැඳින්වෙන අන්නාසි බේරුක්ක වත්ත නමැති ඉඩම ; දකුණට : බී. ඩබ්ලිව්. අමේන්ද්‍ර මහතා අයිතිවාසිකම් කියන වක්වැල්ල පාරේ වරිපනම් අංක 246න් හැඳින්වෙන අන්නාසි බේරුක්ක වත්ත නොහොත් බෝම්සියවත්ත නමැති ඉඩම ; බස්නාහිරට : ගාළු-වක්වැල්ල ප්‍රසිද්ධ මහ පාර.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

අංකය ජේ 59/60 ඊ 71/ඇල් ඒ/ඒ. 198.
1960 පෙබරවාරි මස 6 වැනි දින,
කොළඹදී ය.

---

## 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයා වූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

(1) ගාළු දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මාගාල්ල ගම්මුලාදෑනි වසමේ, මාගාල්ල නමැති ගමේ පිහිටි, ප්‍රමාණයෙන් අක්කර 7ක් පමණවූ, පහත සඳහන් මායිම් තුළ පිහිටි, ගිබට් දූපත නමැති ඉඩම.

උතුරට : මුහුදු වෙරළ සහ මුහුද ; නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : මුහුද.

(2) ගාළු දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මාගාල්ල ගම්මුලාදෑනි වසමේ, ගාළු නාගරික සභා සීමාව තුළ, කොට්ඨාශ අංක 5හේ, මාගාල්ලේ, ගිබට් මාවතේ, වරිපනම් අංක 26, 33, 4/5, 4/6, 4/10 සහ 4/6/1 න් හැඳින්වෙන, මහලුන්නැහේගේවත්ත, කාදර්ගෙවැල්ලඅද්දරවත්ත, වඩුගෙදර වත්ත, සෙම්බකුට්ටිගෙවත්ත නොහොත් සෙකරදාරිස්ගෙවත්ත සහ ගල්ගේවත්ත යන ඉඩම් වලින්, ප්‍රමාණයෙන් අක්කර 3ක් පමණවූ, පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කොටසක්.

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : බී. ආර්. දිසානායක අයිතිවාසිකම් කියන ගිබට් මාවතේ, වරිපනම් අංක 8/1 න් හැඳින්වෙන අබරන්වත්ත නමැති ඉඩම ; දකුණට සහ බස්නාහිරට : මුහුදු වෙරළ.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

අංක : ජේ 59/60 ඇන් ඇස් 79/ඇල් ඒ/සී. 130.
1960ක් වූ පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹදීය.

---

අංකය : ජේ 56 ඇල් ජී 357-ඇල් බී. 2302.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

(1) මාතර දිස්ත්‍රික්කයේ වැළිගම් කෝරලේ ආදායම් නිළධාරි කොටසතුළ මිදිගම නැගෙනහිර ගමේ පිහිටි පනිවිඩමලපලාව නමැති ඉඩමෙන් අඩි 99 × 3 පමන විශාල බිම් තීරුවක්, ඊට මායිම් :—

උතුරට : දම්මලකුඹුර නමැති ඉඩම ; නැගෙනහිරට සහ දකුණට : එම ඉඩමේ ඉතිරි කැබලි ; බස්නාහිරට : කුඩහපැල්ල නමැති ඉඩම.

(2) මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලේ ආදයම් නිළධාරි කොටසතුල මිදිගම නැගෙනහිර ගමේ පිහිටි කුඩහපැල්ල නමැති ඉඩමෙන් අඩි 155 × 3 පමන විශාල බිම් තීරුවක්, ඊට මායිම් :—

උතුරට : රේල් පාර ; නැගෙනහිරට : දම්මලකුඹුර නමැති ඉඩම ; දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කැබලි.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ ඇමති.

1959 ක්වූ දෙසැම්බර් මස 10 වැනි දින,
කොළඹදීය.

---

අංකය : ජේ 56 ඇල් ජී 357-ඇල් බී. 2302.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි ;

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් මිදිගම නැගෙනහිර ගමේ පිහිටි පනිවිඩ මල පලාව නැමැති ඉඩමෙන් 20′ × 20′ පමන ප්‍රමාන බිම් කැබැල්ලක්, ඊට මායිම් :—

උතුරට : මිදිගම නැගෙනහිර පදිංචි දම්මලගේ නෝනිස් අප්පු හිමිකම් කියන දම්මල කුඹුර; නැගෙනහිරට : මිදිගම නැගෙනහිර පදිංචි දම්මලගේ නෝනිස් අප්පු හිමිකම් කියන බෙදුනු වත්ත; දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කැබැල්ල.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

1957 ක්වූ සැප්තැම්බර් මස 10 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයයි

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍ය යයිද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයිද කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය චාල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

යාපනය දිසාවේ ඩෙල්ෆ්ට් ප්‍රදේශයේ, ඩෙල්ෆ්ට් මැද ග්‍රාමයේ පිහිටි තොඩ්ඩාන්වලවු කන්දන් සීමායි නැමැති ප්‍රමාණයෙන් අක්කර 2ක් පමණැති ඉඩම් කැබැල්ලකි. මෙයට,

උතුරින් : ඒ. කන්දයියා හිමිකම් කියන කෝන්වයන්තෝප්පු හා නාගිකන්දන්කුඩල් නැමැති ඉඩම ද; නැගෙනහිරින් : ගම්සභා මාවත හා රජයේ කණිෂ්ඨ පාසැලද; දකුණින් : රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ පාරද; බටහිරින් : ෂන්මුගනාදන් සේතුපිල්ලෙ හිමිකම් කියන පිකුඩල් හා කෝන්වයන් තෝප්පු නැමැති ඉඩමද මායිම් වේ.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යතැන.

මේ සම්බන්ධයෙන් සඳහන් කළ යුතු අමාත්‍යාංශ අංකය :
J 56 E 432.
දිසාපතිතැනගේ අංකය : LA 1114.

1958. 8. 8 වනදා,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශයයි

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍ය යයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

යාපනය දිසාවේ වඩමරාච්චි ප්‍රදේශයේ, උඩුපිඩ්ඩි ග්‍රාමයේ පිහිටි මූන්රාම්සංදිකලඩ්ඩි නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් පර්චස් 27 1/2ක් පමණැති කොටසකි. මෙයට,

උතුරින් හා බටහිරින් : ගම්සභා මාවතක්ද; නැගෙනහිරින් : රජය සතු මූන්රාම්සන්දිකලඩ්ඩි නැමැති ඉඩමද; දකුණින් : ඒ. සින්නතම්බි හිමිකම් කියන මූන්රාම්සන්දිකලඩ්ඩි නැමැති ඉඩමද මායිම් වේ.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යතැන.

මේ සම්බන්ධයෙන් සඳහන් කළ යුතු අමාත්‍යාංශ අංකය :
J 58/59 E 579.
දිසාපතිතැනගේ අංකය : LA. 1154.

1959. 12. 29 වනදා,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම සහ ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, නුගගහගෙදර පලාතේ, නුගගහගෙදර ගමෙහි පිහිටි ගල්කන්දේගේන නැමැති ඉඩමෙන් අ. 0, රූ. 2, ප. 0 පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම්තුල පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : ගටකහට-නුගගහගෙදර ගම්සභා පාර; නැගෙනහිරට : ඇස්. මොහොමඩ් කාසිම් සහ අනිකුත් අයට හිමි ගලහිටියාව කුඹුර නැමැති ඉඩම; දකුණට : ඇස්. සම්සුදීන්ට හිමි පහල ගලහිටියාව නැමැති ඉඩම; බස්නාහිරට : යූ. ඇල්. අලමනච්චිට හිමි ගල්කන්දේවත්ත නැමැති ඉඩම

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකර්ම සහ ඉඩම් ඇමති.

සඳහන් අංකය : ජේ 58/59 ඊ 750.
1960 පෙබරවාරි මස 17 දින,
කොළඹදීය.

---

ඇල්ඒ 111.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අඞක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එස් ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත, 1950හේ අඞක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

බදුලු දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදායම් නිලධාරි කොට්ඨාශයේ උඩකුඹල්වෙල ගම්මුලාදැනි කොටසට අයත්, උඩකුඹල්වෙල ගමතුල පිහිටි යටිතුරේකුඹුර, වටගොඩකුඹුර, ගෙන්දගන්උල්පොත, කිරිගල්පොතකුඹුර සහ උල්ලඅරාවේකුඹුර යන ඉඩම් කැබලි 7කින් සැදුම්ලත් ප. 38.46ක පමණ බිම් ප්‍රමාණයකට මායිම් පහත් දැක්වේ :—

ඒ. කැබැල්ල : ප. 1.17ක පමණ බිම් ප්‍රමාණය.

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස සහ වාරිමාගී ඇල; නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටස; දකුණට සහ බස්නාහිරට : වාරිමාගී ඇල.

බී. කැබැල්ල : ප. 6.09ක පමණ බිම් ප්‍රමාණය.

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස : නැගෙනහිරට : වාරිමාගී ඇල; දකුණට : වාරිමාගී ඇල; බස්නාහිරට : ඇල්. සී. පොඩිඅප්පුහාමි යන අය හිමිකම් කියන වටගොඩකුඹුර නැමති ඉඩම.

සී. කැබැල්ල : ප. 0.84 ක පමණ බිම් ප්‍රමාණය.

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස; නැගෙනහිරට : ඇල්. සී. ඩබ්ලිව්. ජයසේකර යන අය හිමිකම් කියන වටගොඩකුඹුර; දකුණට සහ බස්නාහිරට : වාරිමාගී ඇල.

ඩී. කැබැල්ල : ප. 1.49ක පමණ බිම් ප්‍රමාණය.

උතුරට : එම ඉඩමේම ඉතිරි කොටස; නැගෙනහිරට : දඹගොල්ල ඔය; දකුණට : ප්‍රසිඬ මහ පාර; බස්නාහිරට : ආර්. ඇම්. ජී. බණ්ඩාර යන අය හිමිකම් කියන ගෙන්දගන්උල්පොත නැමති ඉඩම.

ඊ. කැබැල්ල : ප. 7.37ක බිම් ප්‍රමාණය.

උතුරට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස; නැගෙනහිරට : ඇල්. සී. ඊ. ජයසේකර යන අය හිමිකම් කියන කිරිගල්පොතකුඹුර නැමති ඉඩම සහ ප්‍රසිඬ මහ පාර; දකුණට : ආර්. එච්. ඔගස්ටිනා මහත්මිය හිමිකම් කියන කිරිගල්පොතකුඹුර නැමති ඉඩම.

**ඇ/ජ්. කැබැල්ල:** ප. 8.53ක පමණ බිම් ප්‍රමාණය.

උතුරට: ආර්. ඇම්. ජී. බන්ඩාර යන අය හිමිකම් කියන ගෙන්ද ගන්උල්පොත නැමති ඉඩම; නැගෙනහිරට: ප්‍රසිඛ මහ පාර. දකුණට: කතරගම දේවාලය භාරකාරයින් හිමිකම් කියන ගෙන්ද ගන්උල්පොත නැමති ඉඩම; බස්නාහිරට: එම ඉඩමේම ඉතිරි කොටස.

**ජී. කැබැල්ල:** ප. 12.97ක පමණ බිම් ප්‍රමාණය.

උතුරට: ආර්. එච්. ඔගස්ටිනා මහත්මිය හිමිකම් කියන උල්ලේ අරාවේකුඹුර නැමති ඉඩම; නැගෙනහිරට: ප්‍රසිද්ධ මහපාර; දකුණට: පී. වී. ඩී. සුමණසේකර යන අය හිමිකම් කියන උල්ලේ අරාවේ කුඹුර නැමති ඉඩම; බස්නාහිරට: එම ඉඩමේම ඉතිරි කොටස.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකම් හා ඉඩම් පිළිබඳ ඇමති.

සඳහන් අංකය: ජේ. 57. ඊ443.
කොළඹ, 1960.1.13 දින.

---

ඇල්. ඇල්/ඒ. 5890.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ගොවිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් කරමි:

රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත සහ මැද කෝරළේ, මැද කෝරළේ හෙලඋඩ පළාතේ, ගොරොක්ගහමඩ නමැති ගමේ කොටසක පිහිටි (අංක 482 දරන අවසාන ගම් සිතියමේ ලොට් 54) ගොරොක්ගහමඩ වත්ත නමැති ඉඩමෙන් අ. 2, රූ. 0, ප. 7ක පමණ ප්‍රමාණයක්; එහි මායිම් පහත දැක්වේ:—

උතුරට සහ බස්නාහිරට: අංක 482 දරන අවසාන ගම් සිතියමේ ලොට් 54 ඉතුරු කොටස; නැගෙනහිරට: අංක 482 දරන අවසාන ගම් සිතියමේ ලොට් 34; දකුණට: ඇල්ලේපොල ගම් මායිම.

ඩබ්ලිව්. දහනායක,
ගොවිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

**අංකය: ජේ. 55ඊ 420.**

1960ක්වූ පෙබරවාරි මස 10 වැනි දින,
කොළඹදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ගොවිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිවරයාවූ විජයානන්ද දහනායක නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, කොලොන්න නමැති ගමේ පිහිටි අංක 901 දරන ගම් සිතියමේ ලොට්ස් 190 සහ 214 වශයෙන් හැඳින්වෙන අඹහේනවත්ත නොහොත් අළුත්ගෙදර වත්ත සහ අළුත්වලව්වෙවත්ත, ගල්පොටහේන යන ඉඩම් යනාදියෙන් අ. 1, රූ. 3, ප. 0 පමණ ප්‍රමාණයත් සහ එහි මායිම් පහත දැක්වේ:—

උතුරට: රජයේ ඉඩම, (අංක 901 දරන ගම් සිතියමේ ලොට් 174, ප්‍රසිඛ වැඩ දෙපාර්තමේන්තුවේ වෙන්කරන ලද බිම් තීරුව) සහ අංක 901 දරන ගම් සිතියමේ ලොට් 191 පාසැල් සීමාව; නැගෙනහිරට: අංක 901 දරන ගම් සිතියමේ ලොට්ස් 193 සහ 194 ගම්සභා උසාවි බංගලාවේ සීමාව; දකුණට: අංක 901 දරන ගම් සිතියමේ ලොට්ස් 190 සහ 195 කොටස්; බස්නාහිරට: ගම් සභා පාර.

ඩබ්ලිව්. දහනායක,
ගොවිකම් හා ඉඩම් පිළිබඳ ඇමතිතුමා.

1960ක්වූ ජනවාරි මස 25 වැනි දින,
කොළඹදීය.

---

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

**5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය**

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම් සහ ඉඩම් අමාත්‍ය විජයානන්ද දහනායක වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි:

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරලේ සියඹලාපිටිය වසමේ වැලිමන්නාතොට ගමේ කෑගලු නගර සභාවේ අංක 1 කොටසේ බුලත්කොහුපිටිය පාරේ වරිපනම් අංක 122 දරණ තලගහහේන නමැති ඉඩමින් අක්කර 1ක් පමණ වූ පහත සඳහන් මායිම්වලට මැදි වූ බිම් කොටස:—

උතුරට: යූ. සමරසිංහ මහත්මිය අයිතිකම් කියන වරිපණම් අංක 106 දරණ සෞඛ්‍ය නිලධාරි තුමාගේ කාර්‍ය්‍යාලය පිහිටි ඉඩම සහ ඇස්. කළුආරච්චි අයිතිකම් කියන තලගහහේන; නැගෙනහිරට: කෑගල්ල-බුලත්කොහුපිටිය පාර සහ මෙම ඉඩමේ ඉතිරි කොටසක්; දකුණට: වරිපණම් අංක 116 දරණ පබිලිස් අප්පුහාමි අයිතිකම් කියන ඉඩම; බස්නාහිරට: මෙම ඉඩමේ ඉතිරි කොටස.

ඩබ්ලිව්. දහනායක,
කෘෂිකම් සහ ඉඩම් ඇමති.

සඳහන් අංකය: ජේ. 58/59 එස් 630/එල්.එම්. 5795.

1960 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹදීය.

---

අංකය: ආර්/කිව් 120.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

**7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මූලික සැලැස්ම: ඒ 4455, පිහිටීම: කොළඹ නාගරික සීමාව තුළ අංක 19 දරණ කොට්ඨාශය—සුදුවැල්ල.

**කැබැල්ල: 1.**

නම: ඩීන්ස් පාරේ වරිපනම් අංක 355 දරණ ස්ථානයෙන් කොටසක්; විස්තරය: අවුරුදු 75ක්වූ බෝ ගස් 2ක්ද, අවුරුදු 3-50ක්වූ පොල් ගස් 2ක්ද, තහඩු හෙවිල්ලපු කපරාදු කරන ලද ගබඩා 2ක්ද, තහඩු හෙවිල්ලපු කපරාදු කරන ලද දුම් කාමරයක්ද, කපරාදු කරන ලද කොන්ක්‍රීට් වැසිකිළියක් සහ කාණු කවාට දෙකක්ද, රඳාතබන ගඩොල් තාප්පයක්ද, ගඩොල් තාප්ප 3ක්ද, යකඩ සහ ලී ගේට්ටුවක්ද, යකඩ පීලි 26ක් සහ රබර් ෂීට් වියලීමට පොළොවේ සිට අඩි 5-7 උඩින් සවිකළ යකඩ කොකු 16ක් සහ දැල්ද, තහඩුවලින් වසන ලද කපරාදු කරන ලද බින්තියක්ද, විදුලියෙන් ක්‍රියා කරන පෝම්පයක්ද, අත් පෝම්පයක්ද, කපරාදු කරන ලද තහඩු හෙවිල්ලපු වැසිකිළියක්ද, විදුලි පහන් කණුවක්ද වත්තේ තිබෙත්; අයිතිවාසිකම් කියන අයගේ නම: සීමාසහිත (ලංකා) ජේ. එච්. වැවසියර් සහ සමාගම, ඩීන්ස් පාර, කොළඹ; ප්‍රමාණය: අ. 0, රූඩ්ස්. 2, පර්චස්. 33.30.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන්

**ලොට් නො. 1.**

ඉඩමේ නම: කෙටේවත්ත, වරිපනම් අංක 18 දරණ ඉඩමේ කොටස, දකුණු රවුම් පාර; විස්තරය: කොටසක් පොල් ඉඩම (කිසිම ගොවිතැනක් නැත); අයිතිවාසිකම් කියන්නා: ඊ. ජී. ගුණවර්ධන මහත්මිය, "ඕල්ඩ් පෙලේස්", මිහිඳු මාවත, කුරුණෑගල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 14.88.

අත්කර ගැනීමට අදහස් කරන ඉහතකී ඉඩමට සම්බන්ධතාවක් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 අප්‍රේල් මස 18 වැනි දින පස්වරු 3ට කුරුණෑගල කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1960. 4. 11 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
උප ඒජන්ත.

කුරුණෑගල කච්චේරිය,
1960 පෙබරවාරි මස 27 වෙනිදා.

---

අංකය: 3/64/2/7.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනත

**31 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහී ලයනල් ජෝෂප් වික්‍රමරත්න, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 31 වෙනි වගන්තිය යටතේ, මෙහි උප ලේඛනයෙහි විස්තර කර ඇති ඉඩමේ වන්දි මුදල වන රුපියල් එක්දහස් විසිපහක් (රු. 1,025) ඊට හිමිකම් ඇති අයවලුන් විසින් ලබාගැනීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික් උසාවියේ තැන්පත් කරන්ට යෙදුන බව මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1960ක් වූ පෙබරවාරි මස 25 දින,
කුරුණෑගල කච්චේරියේ දිය.

### උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙනි හත්පත්තුවේ වැදෙනිය නමැති ගමෙහි පිහිටි නො. 486 දරණ අ.ග. මැ. සැලැස්මේ මැන වඩා විස්තරව හැඳින්වෙන කැබැලි 63 දරණ අ.0, රූ. 2, ප. 2 විශාලත්වයක් ඇති කජුගහවත්ත නමැති ඉඩම.

---

සැලසුම් අංකය: ඇල්. ආර්. 1686.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා පහත විස්තර දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කර ඇති බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වෙනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වමි.

ලබාගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර පහත පළවේ:—

අවසාන ගම් සිතියම් අංක 866. අංක 1 දරණ අතිරේකය—හොරිවිල

**ලොට් අංකය: 90.**

ඉඩමේ නම: දඹගහ ඉඩම නොහොත් කහටගහ ඉඩම; ඉඩමේ විස්තර: වාරි මාර්ග දෙපාර්තමේන්තුව මගින් තනවන ලද ඇල සහිත මුඩු බිම; හිමිකම් කියන්නෝ: සේනානායක කන්දලාගේ අවුසදහාමි, හොරිවිල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 27.4.

**ලොට් අංකය: 91.**

ඉඩමේ නම: මීගහ ඉඩම; ඉඩමේ විස්තර: වාරි මාර්ග දෙපාර්තමේන්තුව මගින් තනවන ලද ඇල සහිත කුඹුරු ඉඩම; හිමිකම් කියන්නෝ: බණ්ඩප්පුගේ අප්පුහාමි සහ බණ්ඩප්පුගේ වේලාතේ, හොරිවිල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 24.3.

**ලොට් අංකය: 92.**

ඉඩමේ නම: කහටගහ ඉඩම; ඉඩමේ විස්තර: අත්හැරදමන ලද කුඹුරු ඉඩම සහිත වාරි මාර්ග දෙපාර්තමේන්තුව මගින් තනවන ලද ඇල. (කොටසක්); හිමිකම් කියන්නෝ: මැණික්රාලගේ පුංචි අප්පු, සේනාදිරියගම; කපුරුහාමිගේ අප්පුහාමි, කපුරුහාමිගේ මුතු බණ්ඩා සහ කදිරතෙගේ ටිකිරි අප්පු, හොරිවිල; කපුරුහාමිගේ මුදලිහාමි, සේනාදිරියගම; කවුරාලගේ කපුරාල, කවුරාලගේ ටිකිරි මැණිකා, රාලගේ මුදියන්සේ, අප්පුහාමිගේ සීලවතී, අප්පුහාමිගේ කපුරුබණ්ඩා, අප්පුහාමිගේ රාජරත්න, කළුබණ්ඩාගේ සීලවතී, කළුබණ්ඩාගේ පුංචිහාමි සහ කවුරාලගේ හේරත්හාමි, හොරිවිල; උක්කු බණ්ඩාගේ වල්ලිහාමි සහ උක්කු බණ්ඩාගේ රම්මැණිකා සහ උක්කුබණ්ඩාගේ මුතු මැණිකා, සේනාදිරියගම; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 36.8.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 1960 අප්‍රේල් මස 27 දින පෙරවරු 10.30ට අ/සේනාදිරියගම රජයේ පාසැලේදී මා හමුවිය යුතුය.

තවද 1960 අප්‍රේල් මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ඩබ්ලිව්. බී. සී. සෙනරත් නන්දදේව,
අනුරාධපුර උප දිසාපති.

1960 පෙබරවාරි මස 16 වැනි දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේදිය.

---

සැලසුම් අංකය: ඇල්. ආර්. 1685.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**7 වෙනි වගන්තිය යටතේවූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට රජය අදහස් කර ඇති බැව් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වෙනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දන්වමි.

ලබාගැනීමට අදහස් කර ඇති ඉඩම්වල විස්තර:—

අංක 866 දරණ අවසාන ගම් පිඹුරට අයත් 2 වැනි අතිරේකය.—හොරිවිල ගම, හුරුළු පළාත, අනුරාධපුර දිස්ත්‍රික්කය.

**ලොට් අංකය: 93.**

ඉඩමේ නම: නිකවුගම—පුරාණවෙල; විස්තර: කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් තනවන ලද ඇලක කොටසක් සහිතව; හිමිකම් කියා සිටින්නාගේ නම: පුංචිරාලගේ කපුරුහාමි, හොරිවිල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 17.2

**ලොට් අංකය: 94.**

ඉඩමේ නම: නිකවුගම—පුරාණවෙල; විස්තර: කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් තනවන ලද ඇලක කොටසක් සහිතව; හිමිකම් කියා සිටින්නාගේ නම: අක්කුරාලගේ කුඩාරාල, හොරිවිල; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 04.6.

**ලොට් අංකය: 95.**

ඉඩමේ නම: නිකවුගම—පුරාණවෙල; විස්තර: කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් තනවන ලද ඇලක කොටසක් සහිතව; හිමිකම් කියා සිටින්නෝ: බණ්ඩප්පුගේ අප්පුහාමි සහ වේලාගේ කිරිමැණිකා, හොරිවිල සහ සිරාලගේ මල්හාමි, සේනාදිරියගම; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 13.1.

**ලොට් අංකය: 96.**

ඉඩමේ නම: නිකවුගම—පුරාණවෙල; විස්තර: කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් තනවන ලද ඇලක කොටසක් සහිතව; හිමිකම් කියා සිටින්නා: අප්පුරාලගේ කුඩාරාල, හොරිවිල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 14.2.

**ලොට් අංකය: 97.**

ඉඩමේ නම: නිකවුගම—පුරාණවෙල; විස්තර: කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් තනවන ලද ඇලක කොටසක්

සහිතව ; හිමිකම් කියා සිටින්නෝ : කිරිහාමිගේ උක්කුමැණිකා සහ කපුරුහාමිගේ කළුමැණිකා, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 19.4.

**ලොට් අංකය : 98.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නෝ : කපුරුහාමිගේ අප්පුහාමි, හොරිවිල, කපුරුහාමිගේ මුතුබණ්ඩා, සේනාදිරියාගම, අප්පුහාමිගේ කපුරුබණ්ඩා, අප්පුහාමිගේ රාජරත්න, කළුබණ්ඩාගේ පුංචිහාමි සහ කළුබණ්ඩාගේ සීලවතී, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 16.6.

**ලොට් අංකය : 99.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නෝ : බණ්ඩප්පුගේ කපුරාල සහ මල්හාමිගේ රන්මැණිකා, සේනාදිරියාගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 08.7.

**ලොට් අංකය : 100.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නෝ : අප්පුරාලගේ කළුබණ්ඩා, හොරිවිල සහ බණ්ඩප්පුගේ මුතුමැණිකා, මුරුන්ගාහිටිකන්ද, මඩලුගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.9.

**ලොට් අංකය : 101.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නෝ : සීරාලගේ මල්හාමි, මැණික්රාලගේ පුංචිඅප්පු, මැණික්රාලගේ රන්හාමි, සේනාදිරියාගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 14.

**ලොට් අංකය : 102.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නාගේ නම : පුංචිරාලගේ කපුරුහාමි, හොරිවිල ; අ. 0, රූ. 0, ප. 06.1.

**ලොට් අංකය. 103.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නාගේ නම : පිකිරිඅප්පුගේ හේරත්හාමි, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.6.

**ලොට් අංකය : 104.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නා : කන්දාතෙගේ අවුසදහාමි, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.8.

**ලොට් අංකය : 105.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නාගේ නම : කපුරාලගේ උක්කුබණ්ඩා, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.2.

**ලොට් අංකය : 106.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නාගේ නම : මල්හාමිගේ පින්හාමි, සේනාදිරියාගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.8.

**ලොට් අංකය : 107.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නෝ : මල්හාමිගේ පුංචිමැණිකා, මල්හාමිගේ ඩිංගිරි බණ්ඩා, මල්හාමිගේ අප්පුහාමි, මල්හාමිගේ කිරිහාමි සහ සෙල්ලාතෙගේ කිරිබණ්ඩා, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 07.3.

**ලොට් අංකය : 108.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නෝ : පුංචප්පුගේ රන්මැණිකා සහ පුංචිඅප්පුගේ උක්කු මැණිකා, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 05.1

**ලොට් අංකය : 109.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියාසිටින්නාගේ නම : පුංචිරාලගේ කපුරුහාමි, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 03.6

**ලොට් අංකය : 110.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම ; හිමිකම් කියා සිටින්නාගේ නම : මල්හාමිගේ ඩිංගිරි බණ්ඩා, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.8.

**ලොට් අංකය : 111.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම ; හිමිකම් කියා සිටින්නෝ : සෙල්ලාතෙගේ කිරි බණ්ඩා, හොරිවිල සහ සෙල්ලාතෙගේ මොහොට්ටාල, සේනාදිරියාගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 00.8.

**ලොට් අංකය. 112.**

ඉඩමේ නම : නිකවුගම—පුරාණවෙල ; විස්තර : කුඹුරු ඉඩම සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් තනවන ලද ඇලක කොටසක් සහිතව ; හිමිකම් කියා සිටින්නාගේ නම : කපුරාලගේ පුංචි බණ්ඩා, හොරිවිල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.1.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුනගේ ලියවිලි වලින් බලය ලත් අයවළුන් හෝ 1960 අප්‍රේල් මස 27 වන දින පෙරවරු 9.30 ට අ/සේනාදිරියාගම රජයේ පාසැලේදී මා හමුවිය යුතුයි.

තවද 1960.4.20 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මාවෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්ලිව්. බී. සී. සෙනරත් නන්දදේව,
අනුරාධපුර උප දිසාපති වෙනුවට.

1960 පෙබරවාරි මස 16 දින,
අනුරාධපුර දිසාපති කාර්යාලයේ දී ය.

---

අංකය : ඇල් ඇල්/ඒ. 6123

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩපත්තු උතුරේ බටතොට නමැති ගමේ පිහිටි අංක 355 දරණ අවසාන ගම් සිතියමේ 3 වෙනි අතිරේකයේ ලොට් 199 වන මැන විස්තර කරන ලද පහත සඳහන් ඉඩම.

**ලොට් : 199**

ඉඩමේ නම : ගල්කොටුවෙහේන්යායෙ වත්ත ; විස්තර : අවු. 25ක්වූ කොස්ගස් 5ක් ද, අවු. 8ක් වූ පුවක්ගස් 2ක් ද, අවු. 8ක්වූ අඹගසක් ද, සිමෙන්තියෙන් බඳිනලද වහලය සහිත වැසිකිලියක් ද, සින්ක් තහඩු සෙවිලිකළ සිමෙන්තියෙන් බඳින ලද ගුරුනිවාස සහ සින්ක් තහඩු සෙවිලි කරන ලද පාසැල සහිත ඉඩම ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 01 ; අයිතිවාසිකම් කියන්නා : ඒ. ඒ. ඩී. රොසලින් ද සිල්වා මහත්මිය, කලුබෝවිල, දෙහිවල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 අප්‍රේල් මස 18 වෙනි දින උදේ 10.30ට කුරුවිට ප්‍රාදේශීය ආදායම් පාලක කාර්‍යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1960 අප්‍රේල් 9 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එන්. පී. ජේගනාදන්,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වර්ෂ 1960ක් වූ පෙබරවාරි මස 24 දින,
රත්නපුර කච්චේරියේදීය.

---

අංකය : ජේ. 56 ඊ 486- -3/63/43

### ශුද්ධිය

1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් ලබා ගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තිය යටතේ ගරු ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමතිතුමා විසින් 1959.23.1 වෙනි දින අංක 11,645 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙන් කල ප්‍රකාශනයේ 3 වෙනි සහ 4 වෙනි පේලිවල සඳහන් ඉඩමේ විස්තරය අංක 212 දරණ අවසාන ගම් මැනීමේ සැලැස්මේ කට්ටි නොම්මර 18ආර් සහ 22 කපාහැර ඒ වෙනුවට අංක 212 දරණ අවසාන ගම් මැනීමේ සැලැස්මේ නොම්මර 18ඊ1, 18වයි, 17 සහ 18වී යන ලෙස වෙනස් කළ යුතුය.

---

අංකය : ජේ 58/59 එල් ජී233-3/62/4/117.

### ශුද්ධිය

1959 ජූනි මස 12 වෙනි දින අංක 11,771 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරණ ලද 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 5 වෙනි වගන්තිය යටතේ 1959. 5. 13 වෙනි දින ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමැති තුමාගේ ප්‍රකාශයේ දී ඇති ඉඩම් විස්තර වන 4 වෙනි පේලියේ "35 බී" යන්නට පසු "සහ කැබැලි 34ඒ වලින් කොටසක්" යන්න යොදා "අංක 468 දරණ අ. ග. මැ. සැ. කැබැලි 35බී සහ කැබැලි 34ඒ වලින් කොටස් සහ 35සී" යනුවෙන් කිය විය යුතුයි.

0

---

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය : ඇල් ඇස්. 4329.

### 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩ පත්තුවේ ඊරියතොට පිහිටි 183 දරණ අවසාන ගම් සිතියමේ අංක 47 දරණ ඉඩම් කට්ටියෙන් අඩි 75 × අඩි 50 බිම් ප්‍රමාණයක් පෝෂකම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ලක් තැනීම පිණිස කඹුරුපිටියේ නාරන්දෙණිය ග්‍රාම සංවර්ධන සමිතියේ භාරකරුවන් වන ඩී. ඩී. ඇස්. යාපා, ඩී. කේ. අන්දිරිස් සහ ඩී. ඩී. සයිමන් යන මහත්වරු බදු ඉල්වා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. ඉල්ලුම් කර ඇති ඉඩම ඇම්ආර්/ඊරියතොට රජයේ සිංහල (මිශ්‍ර) පාසැල් භූමියේ කොටසකි. අවශ්‍ය කටයුත්ත සඳහා මෙම සමිතියට එම භූමියෙන් කොටසක් බදු දෙන්නැයි ගරු අධ්‍යාපන ඇමති තුමා නියෝග කර තිබේ. එබැවින් ආණ්ඩුවේ සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට එම ඉඩම බදු දීමට යෝජනා කර ඇත :—

(අ) කාලය : අවුරුදු 5යි ;

(ඉ) බද්ද : අවුරුද්දකට රු. 1යි ;

(උ) බදු ගන්නන් විසින් බද්ද ආරම්භවූ අවුරුද්දක් ඇතුළත මාතර දිස්ත්‍රික්කයේ දිසාපති තැනගේ සිත්ගන්නා පරිද් දෙන් එම ඉඩමෙහි පෝෂකම් මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතුයි ;

(එ) බදු ගන්නන් විසින් මෙම ඉඩම පෝෂකම් මධ්‍යස්ථානයක් පිහිටුවීම පිණිස යොදනවා විනා අන්‍ය කටයුත්තකට නො යෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති 6ක් ඇතුළත මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු ලියා මාවෙත ඉදිරිපත් නොකළ හොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 මාර්තු 4 වැනි දින,
කොළඹදීය.

---

අංකය : ඇල්. ජේ. 1653 3/21/595.

### 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දේවමැදි හත්පත්තුවේ බලදොර කෝරළයට අයත් වලස්වැව ගමෙහි, අංක 1629 දරණ අවසාන ගම් පිඹුරයේ අංක 2 සී දරණ බිම් කැබැල්ලෙන් අක්කර 1ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වලස්වැව ශ්‍රී අග්‍රබෝධි විහාර දායක සභාවේ භාරකරුවන් වන පූජ්‍ය තියරලියද්දේ සරණපාල, ස්ථවිර සහ වලස්වැව පදිංචි, අභයනායක මුදියන්සේලාගේ හේතුහාමී, කරුණානායක අතුකෝරාලලාගේ ජේම්ස් අප්පුහාමි සහ අභයකෝන් මුදියන්සේලාගේ බස්තියන් අප්පුහාමි යන මහතුන් විසින් මීට යාවවූ පෞද්ගලික ඉඩමෙහි පිහිටා තිබෙන බෞද්ධ විහාරස්ථානය පුළුල් කිරීමෙහිලා එහි තවත් ගොඩනැගිලි තැනීම සඳහා බදු ඉල්ලා ඇත.

2. දැනට පන්සල පිහිටා තිබෙන ඉඩම යෝජිත ගොඩනැගිලි සඳහා ප්‍රමාණවත් නොවන බැව් වාර්තාවේ. ඉඩම බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට ඇත :—

(අ) බදු මුදල : වර්ෂයකට ශත 50 යි ;

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 2ක් ඇතුළතදී කුරුණෑගල දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි ඉඩමෙහි ධර්මශාලාවක්, ලැගුම්ගෙයක්, දන ශාලාවක් සහ වැසිකිළියක් තනා නිම කළ යුතුය ;

(ඉ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ විහාරස්ථානයක් තැනීම පිණිස මිස අන් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය ;

(ඊ) බදු ගන්නන් විසින් (ආ) ඡේදයෙහි සඳහන් ගොඩනැගිලි සාදා නිම කොට සමසක් ඇතුළත ඒවා මහ භාරකාර තැනගේ අනුමැතිය ලද ඔප්පුවකින් පූජා කළ යුතුය. මෙසේ කළ පසු, ප්‍රස්ථාවේ හැටියට භාරකාර තැනට හෝ විහාරස්ථානයේ පාලක විහාරාධිපතීන් වහන්සේට හෝ ඉඩම සඳහා 99 අවුරුද්දක බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත දැක්වෙන දිනයේ සිට සති 6ක් ඇතුළතදී මෙකී ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් යථෝක්ත ඉල්ලීම පරිදි ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1960 මාර්තු මස 4 වැනි දින,
කොළඹදීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෝස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1** වැනි දින සිට අය කරන ගාස්තු මෙසේ යි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම **පස්වරු 3.30ට** සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති** තැනට **ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | 25 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 31 | |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | 10 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 14 | |

15. **පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ.** මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.